# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2208/10 – 2020 දෙසැම්බර් මස 28 වැනි සඳුදා – 2020.12.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : IR/COM/05/2017/115.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4 (1) වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ 2018.03.20 වන දින අංක 2063/22 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2018.03.16 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

නිදහස් වෙළඳ කලාපය සහ පොදු සේවා සේවක සංගමය, අංක 141, ආනන්ද රාජකරුණා මාවත, කොළඹ 10.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

රීගල් කැලිබර් ලංකා ලිමිටඩ්, අංක 37, චැපල් පාර, නුගේගොඩ.

අතර පවත්නා 2018.02.27 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ටී. පියසෝම මයා වෙත යොමු කරන ලදී.


1A – G 33378 – 25(2020/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දන් පෙනී යන හෙයින් කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මා එම නියෝගය අවලංගු කරන අතර, එකී 2018.03.16 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2020 දෙසැම්බර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/05/2017/115.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

නිදහස් වෙළඳ කලාප සහ පොදු සේවා සේවක සංගමය, අංක 141, ආනන්ද රාජකරුණා මාවත, කොළඹ 10.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

රීගල් කැලිබර් ලංකා ලිමිටඩ්, අංක 37, වැපල් පාර, නුගේගොඩ.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බත්තරමුල්ල, තලංගම දකුණ, දේවාල පාර, පළමු පටුමග 204/2, නීතිඥ ප්‍රියන්ත උපාලි අමරසිංහ මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2020 දෙසැම්බර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/05/2017/115.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*

නිදහස් වෙළඳ කලාපය සහ පොදු සේවා සේවක සංගමය, අංක 141, ආනන්ද රාජකරුණා මාවත, කොළඹ 10.

*සහ*

*අනෙක් පාර්ශවය වශයෙන්,*

රීගල් කැලිබර් ලංකා ලිමිටඩ්, අංක 37, චැපල් පාර, නුගේගොඩ.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

''රීගල් කැලිබර් ලංකා ලිමිටඩ් ආයතනයේ සේවකයින්ට සෑම වර්ෂයකම අප්‍රේල් මස ගෙවන ලද මාසයක ප්‍රසාද දීමනාව 2017 අප්‍රේල් මස නොගෙවීම මගින් හා 2017 අප්‍රේල් මස 20 වන දින සිට 2017 අප්‍රේල් මස 26 වන දින තෙක් පැවති වැඩ වර්ජනයට සහභාගි වීම හේතුවෙන් එම සේවක සේවිකාවන්ගේ 2017 අප්‍රේල් මස පැමිණීමේ දීමනාව අහිමි කිරීම මගින් අසාධාරණයක් සිදුව තිබේද යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහන කවරේද යන්නත් පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 නොවැම්බර් මස 24 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ කාර්යාලයේ දී දින යොදන ලදී.

01 - 44

---

මගේ අංකය : IR/COM/05/2018/40 .

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4 (1) වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ 2018.06.29 වන දින අංක 2077/41 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2018.06.25 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

සමස්ථ ලංකා වෙළඳ හා කර්මාන්ත කම්කරු සංගමය, අංක 457, කොල්වින් ආර්. ද සිල්වා මාවත, කොළඹ 02.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

01. ඩෝල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්, 12 වන මහල, පාක්ලන්ඩ් ගොඩනැගිල්ල, අංක 33, පාක් වීදිය, කොළඹ 02, 02. වීරසිංහ මැන් පවර් සප්ලයර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 333 ඒ, නුවර පාර, කිරිල්ලවල.

අතර පවත්නා 2018.06.22 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ටී. පියසෝම මයා වෙත යොමු කරන ලදී. යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දූන් පෙනී යන හෙයින් කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මා එම නියෝගය අවලංගු කරන අතර, එකී 2018.06.25 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2020 දෙසැම්බර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/05/2018/40.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශවයක් වශයෙන්,*

සමස්ථ ලංකා වෙළඳ හා කර්මාන්ත කම්කරු සංගමය, අංක 457, කොල්වින් ආර්. ද සිල්වා මාවත, කොළඹ 02.

*සහ*

*අනෙක් පාර්ශවය වශයෙන්,*

01. ඩෝල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්, 12 වන මහල, පාක්ලන්ඩ් ගොඩනැගිල්ල, අංක 33, පාක් වීදිය, කොළඹ 02, 02. වීරසිංහ මැන් පවර් සප්ලයර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 333 ඒ, නුවර පාර, කිරිල්ලවල.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මොරටුව, සී.පී.ඩී. සිල්වා මාවත, අංක 1/35, නීතිඥ සංජීව අනුරාධ ඇන්තනී මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2020 දෙසැම්බර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/05/2018/40.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

සමස්ථ ලංකා වෙළඳ හා කර්මාන්ත කම්කරු සංගමය, අංක 457, කොල්වින් ආර්. ද සිල්වා මාවත, කොළඹ 02.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

01. ඩෝල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්, 12 වන මහල, පාක්ලන්ඩ් ගොඩනැගිල්ල, අංක 33, පාක් වීදිය, කොළඹ 02, 02. වීරසිංහ මැන් පවර් සප්ලයර්ස් (ප්‍රයිවට් ලිමිටඩ්) අංක 333 ඒ, නුවර පාර, කිරිල්ලවල.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

''ඩෝල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයට අයත් ඌව කුඩා ඔය ගොවිපළෙහි සේවකයින්ට වයස අවුරුදු 55 ඉක්මවා සේවය කිරීමට අවස්ථාව ලබා නොදීමට ගෙන ඇති තීරණයෙන් සේවක පාර්ශ්වයට අගතියක් සිදුවී තිබේද? එසේ අගතියක් සිදුව ඇත්නම් ලැබිය යුතු සහන කවරේද යන්න සහ 2018 ජනවාරි මාසයේදී වැඩ වර්ජනය කළ දින 15 ට අදළ වැටුප වැඩ වර්ජිත සේවකයින්ට හිමිවිය යුතුද යන්න පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 දෙසැම්බර් 10 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ කාර්යාලයේ දී දින යොදන ලදී.

01 - 45

---

මගේ අංකය : IR/COM/04/2016/84.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4 (1) වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ 2020.07.09 වන දින අංක 2183/36 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2020.04.03 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ නිදහස් සේවක සංගමය, අංක 118/එන්/19, එගොඩ කනත්ත, බෝපේ, ගාල්ල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය, අංක 19, පහළ ඩික්සන් පාර, ගාල්ල.

අතර පවත්නා 2020.02.07 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ඩී. එම්. කරුණාරත්න මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින් කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මා එම නියෝගය අවලංගු කරන අතර, එකී 2020.04.03 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2020 දෙසැම්බර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/04/2016/84.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ නිදහස් සේවක සංගමය, අංක 118/එන්/19, එගොඩ කනත්ත, බෝපේ, ගාල්ල.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය, අංක 19, පහළ ඩික්සන් පාර, ගාල්ල.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බදුල්ල, කැප්පෙටිපොල පාර, අංක 322, නීතිඥ ධනුෂ්ක වැලිගම මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2020 දෙසැම්බර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/04/2016/84.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ නිදහස් සේවක සංගමය, අංක 118/එන්/19, එගොඩ කනත්ත, බෝපේ, ගාල්ල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය, අංක 19, පහළ ඩික්සන් පාර, ගාල්ල.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

''දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ නිදහස් සේවක සංගමයේ ලේකම් වශයෙන් හා පුද්ගලිකව අංක A-3609 දරන නඩුවේ සේවක පාර්ශවයේ නියෝජිත වශයෙන් පෙනී සිටි දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සේවයේ නියුතු ඒ. හේවාගම මහතාට එකී අංක A - 3609 දරන බේරුම්කරණ නඩුවේ සේවක පාර්ශවයේ නියෝජිතයා වශයෙන් පෙනී සිටි දිනයන් සඳහා නිවාඩු අනුමත කරන ලෙස ඉල්ලා ඇතත්, එම නිවාඩු වැටුප් රහිත නිවාඩු ලෙස ආයතනය විසින් තීරණය කිරීම තුළින් අසාධාරණයක් සිදුවී තිබේද? එසේ සිදු වී තිබේනම් ඔහුට ලැබිය යුතු සහන කවරේද'', යන්න පිළිබඳව වේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 දෙසැම්බර් මස 08 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ කාර්යාලයේ දී දින යොදන ලදී.

01 - 46

---

මගේ අංකය: IR/COM/03/2019/83.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එච්. එන්. කේ. සිල්වා මිය, අංක 171/4, කොටුව වත්ත, කන්ද පන්සල පාර, මහ වස්කඩුව, වස්කඩුව.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය , අංක 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී

ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කැළණිය, දළුගම, නුවර පාර, අංක 67 ඒ, නීතිඥ බන්දුල වෙල්ලාල මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2020 දෙසැම්බර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/03/2019/83.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එච්. එන්. කේ. සිල්වා මිය, අංක 171/4, කොටුව වත්ත, කන්ද පන්සල පාර, මහ වස්කඩුව, වස්කඩුව.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය , අංක 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

''ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් පවත්වන ලද විනය පරීක්ෂණය හේතුවෙන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සේවයේ නියුතු එච්. එන්. කේ. සිල්වා මහත්මියට පහත සඳහන් කරුණු මගින් අසාධාරණයක් සිදුව තිබේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඇයට හිමිවිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ.''

01. රු. 250,000/- ක මුදලක් වාරික 60 කින් අයකර ගැනීම
02. වැටුප් වර්ධක තුනක් විලම්භනය කිරීම හා
03. ඇයට උසස්වීමක් හිමි නම් එය අහිමි කිරීම.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 නොවැම්බර් මස 20 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ කාර්යාලයේ දී දින යොදන ලදී.

01 - 47

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.